## පළමුවන දේව ප්‍රකාශනය

ප්‍රඥ 2:12, 17-20

සලමොන්ගේ ප්‍රඥාව නමැති පොතෙන් උපුටා ගත් කොටසකි.

**"දැහැමියා ලජ්ජා සහිත මරණයට හෙළා දමමු."**

දැහැමියා අපට කරදර කරන බැවින් ද, අපේ ජීවිත ක්‍රමයට විරුද්ධ වන බැවින් ද, නීතිය කඩ කරන විට අපට දෙස් පවරන බැවින් ද, විනයට විරුද්ධව ක්‍රියා කිරීම ගැන අපට චෝදනා කරන බැවින් ද, අපි ඔහු එනතෙක් සැඟවී බලා සිටිමු. ඔහු පවසන දේ ඇත්තද කියා බලමු. ඔහුට ලැබෙන අන්තිමය කුමන එකක් ද කියා සෝදිසි කරමු. දැහැමියා දෙවිඳුන්ගේ පුත්‍රයා නම් දෙවිඳුන් ඔහුට පිහිට වී සතුරාගේ ග්‍රහණයෙන් ඔහු මුදනු ඇත. ඔහුට කෲර ලෙස වද දී ඔහු පරීක්ෂා කරමු. මෙලෙස ඔහුගේ ශ්‍රේෂ්ඨත්වය සොයා බලමු. ඔහුට ගැළවීම ලැබේ යයි ඔහු කියා සිටින හෙයින් ලජ්ජා සහිත මරණයකට ඔහු හෙළා දමමු.

දේව වාක්‍යය එසේ ය. දෙවියන් වහන්සේට ස්තෝත්‍ර වේවා.

## පිළිතුරු ගීය

ගීතාවලිය 54:1-4, 6

පිළිතුර: දෙවිඳාණෙනි මාගේ සහායට වඩින සේක.

ගීය: අහෝ දෙවිඳුනි, ඔබ නාමයේ අනුහසින් මා මුදාලුව මැනව; ඔබ බල මහිමයෙන් මා නිදහස් කළ මැනව; දෙවිඳුනි, මාගේ යැදුමට සවන් දුන මැනව; මා පවසන වදනට ද සවන් දුන මැනව.

විදේශිකයෝ මට විරුද්ධ ව නැගිට්ටෝ ය; සාහසිකයෝ මා මරන්නට සෙවුවෝ ය. මාගේ අධිපතියාණන් දෙවිඳුන් බව ඔව්හු නොපිළිගත්තෝ ය. දෙවිඳාණෙනි මාගේ සහායට වඩින සේක.

සමිඳාණෙනි මාගේ දිවියට රැකවරණය දෙන සේක. තුටුපහටු සිතින් මම ඔබට පඬුරු පුදන්නෙමි. සමිඳුනි, සැබැවින් ම ඔබ යහපත් බැවින් මම ඔබේ නාමය පසසන්නෙමි.

## දෙවන දේව ප්‍රකාශනය

ජාකොබ් 3:16-4:3

ජාකොබ් තුමන් විසින් ලියන ලද හසුනෙන් කොටසකි.

**(දමිටුකම සාම දූතයන් වපුළ බීජවලින් නිපදවන අස්වැන්නකි.)**

ඊර්ෂ්‍යාවත් උන්නතිකාමයත් කොතැන ද එතැන අවුල්-වියවුල් ද සියලු නපුරු ක්‍රියා ද ඇත්තේ ය. එහෙත් ලෝකෝත්තර ප්‍රඥාව පළමුකොට නිර්මල ය, ඊළඟට සාමකාමී ය, සානුකම්පිත ය, යුක්ති සහගත ය; එය දයාවෙන් හා යහපත් ඵලවලින් පූර්ණ ව, පක්ෂවාදිකමින් ද කුහකකමින් ද තොර ව පවතී. සැබෑ දමිටුකම වූකලී සාම දූතයන් සාමයෙන් වපුළ බීජවලින් නිපදවන අස්වැන්නකි. ඔබ අතර ආරාවුල් හා කලකෝලාහල ඇති වෙන්නේ කෙසේ ද? ඒවා හටගන්නේ ඔබගේ ඉඳුරන් තුළ සටන් කරන තෘෂ්ණාවලින් නොවේ ද? ඔබ යමකට ආසා වන්නහු ය; එහෙත් එය ඔබට ලැබෙන්නේ නැත; ඒ නිසා ඔබ මිනී මරන්නහු ය. ඔබ ඊර්ෂ්‍යා කරන්නහු ය; ඔබට තෘප්තියක් නැත. ඔබ දබර කරන්නහු ය; සටන් කරන්නහු ය. නො ඉල්ලන නිසා ඔබට ලැබෙන්නේ නැත. ඔබ ඉල්ලුවත්, වැරදි ලෙස ද ආත්මාර්ථකාමී තෘප්තිය සඳහා ද ඉල්ලන බැවින් එය නොලැබෙන්නේ ය.

දේව වාක්‍යය එසේ ය. දෙවියන් වහන්සේට ස්තෝත්‍ර වේවා.

## **සුපුවත් ජය නද** 
ජොහන් 8:12

ආලේලූයා! ආලේලූයා!
"ලෝකයේ ආලෝකය මම ය; මා අනුගමනය කරන්නා
ජීවනයේ ආලෝකය ලබන්නේ ය"යි සමිඳාණන් වහන්සේ වදාරණ සේක.
ආලේලූයා!
***හෝ***
ආලේලූයා! ආලේලූයා! 
2 තෙසලෝනික 2:14
සුබ අස්න මගින් දෙවියන් වහන්සේ අපගේ ස්වාමීන් වන ජේසුස් ක්‍රිස්තුන් වහන්සේගේ මහිමයට පංගුකාරයන් වන පිණිස අප කැඳවූ සේක.
ආලේලූයා!

## **ශුද්ධවූ සුවිශේෂය**
මාක් 9:30-37

මාක් තුමාගේ ශුද්ධවූ සුවිශේෂයෙන් උපුටා ගත් කොටසකි.

**("ප්‍රථමයා වන්න කැමැත්තේ හැමගේ සේවකයා විය යුතු ය.")**

ජේසුස් වහන්සේ හා ශ්‍රාවකයින් ද එතැනින් නික්ම ගලීලය මැදින් ගියහ. ඒ බව කිසිවෙකු දැනගැනීම උන් වහන්සේගේ කැමැත්ත නො වී ය. කුමක්නිසා ද, උන් වහන්සේ, "මනුෂ්‍ය–පුත්‍රයාණෝ මිනිසුන් අතට පාවා දෙනු ලබති; ඔව්හු එතුමාණන් මරන්නෝ ය. මරනු ලැබූ පසු එතුමාණෝ තෙ දිනකින් නැවත නැගිටින්නාහ"යි ශ්‍රාවකයන්ට ඉගැන්වූ බැවිනි. එහෙත් ඒ කීම ඔවුන්ට අවබෝධ නො වී ය. උන් වහන්සේගෙන් අසන්නටත් ඔව්හු බිය වූ හ. ඔව්හු කපර්ණවුමට පැමිණියහ. උන් වහන්සේ ගෙයි සිටි කල, "ඔබ මග දී කුමක් ගැන විවාද කළහු දැ"යි ඔවුන්ගෙන් ඇසූ සේක. එහෙත් ඔව්හු නිහඬ වූ හ. මන්ද, වඩා උසස් කවරෙක් දැ යි මග දී තම තමන් අතර ඔවුන් විවාද කළ බැවිනි. එකල උන් වහන්සේ වැඩහිඳ දොළොස් දෙනා කැඳවා, "ප්‍රථමයා වන්න කැමැත්තේ හැමට ම අන්තිමයාත්, හැමගේ සේවකයාත් විය යුතු ය"යි ඔවුන්ට වදාළ සේක. උන් වහන්සේ කුඩා දරුවෙකු ගෙන ඔවුන් මැද සිටුවා ඔහු තුරුල් කරගෙන, "මෙබඳු කුඩා දරුවන්ගෙන් එකෙකු මාගේ නාමයෙන් පිළිගන්නා, මා පිළිගන්නේ ය. මා පිළිගන්නා, පිළිගන්නේ මා නොව, මා එවා වදාළ තැනැන් වහන්සේ ය"යි ඔවුන්ට වදාළ සේක.

සමිඳාණන් වහන්සේගේ සුභාරංචිය මෙසේ ය. ක්‍රිස්තුනි ඔබ වහන්සේට ප්‍රශංසා වේවා.

ලබන ඉරුදින දේව ප්‍රකාශන සඳහා http://sinhalagospel.lk/ වෙත පිවිසෙන්න.